# අභිනව නිවහල් පෙරමුණ
# புதிய சுதந்திர முன்னணி
# New Independent Front

(A recognized political party under the Parliamentary Elections Act, No. 1 of 1981)


31 ජුලි 2024

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ ලේකම් කාර්යාලය,
රාජගිරිය.

ගරු සභාපති තුමනි,

**<u>වර්ෂ 2024 ජනාධිපතිවරණ ස්වාධීන අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතා සම්බන්ධ පැමිණිල්ල</u>**

දැනට ස්වාධීන අපේක්ෂකයකු ලෙස ඇප මුදල් තැන්පත් කර සිටින වත්මන් ජනාධිපති, එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සම්බන්ධයෙන් කරන මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ල.

ඊයේ (30) දිනයේ ජනාධිපති මාධ්‍ය අංශය විසින් මාධ්‍යයට මුදා හරින ලද නිවේදනයකට අනුව, ස්වාධීන ජනාධිපතිවරණ අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතා, අග්‍රාමාත්‍යවරයා, මහජන ආරක්ෂක අමාත්‍යවරයා ඇතුළු ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩයම, ජනාධිපති ලේකම් කාර්යාලය වෙත කැඳවා, එළඹෙන ජනාධිපතිවරණයේ දී ඔහුට සහය ලබා ගැනීම සඳහා හමුවක් සිදු කර තිබේ. එම සාකච්ඡාව අදාළ ජය රූප , වීඩියෝ දර්ශන සහ නිල මාධ්‍ය නිවේදනය ජනාධිපති මාධ්‍ය අංශය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කර තිබේ.

තමා ස්වාධීන ජනාධිපතිවරණ අපේක්ෂකයකු යැයි ප්‍රකාශ කරමින්, ජනාධිපතිවරයා ලෙස තමාට පැවරී ඇති වගකීමක් වන පොලිස්පතිවරයා පත්කිරීමේ කාර්ය පවා මග හරිමින් කටයුතු කරන රනිල් වික්‍රමසිංහ මහතා, මෙසේ මහජන මුදලින් නඩත්තු වන ජනාධිපති ලේකම් කාර්යාලය, එහි සම්පත්, මහජන මුදලින් වැටුප් ලබන කාර්ය මණ්ඩලයක් සහිත ජනාධිපති මාධ්‍ය අංශ භාවිතා කරමින් තම ජනාධිපති මැතිවරණ ව්‍යාපාරයට අදාළ සාකච්ඡා පවත්වමින් පුළුල් ප්‍රචාරයක් ලබා ගැනීමට කටයුතු කිරීම පිළිකුල් සහගත ව හෙළා දකින අතර, එය 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සහ 2023 අංක 3 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත, අමු අමුවේ උල්ලංඝනය කිරීමක් බව අවධාරණය කිරීමට කැමැත්තෙමි

මෙවැනි රාජ්‍ය මුදල් අවභාවිතය කරමින් රනිල් වික්‍රමසිංහ විසින් සිදු කරන ඔහුගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු අප වැනි ධනවත් සහ ප්‍රභූ නොවන, මැතිවරණ අණපනත් අනුව කටයුතු කරන ජනාධිපතිවරණ අපේක්ෂකයන්ට දැඩි අසාධාරණයක් සිදු වන නිසා මේ පිළිබඳ ව කටයුතු කරන මෙන් ඔබෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මිට විශ්වාසී,

.........................................

සභාපති
අභිනව නිවහල් පෙරමුණ

සභාපති / ජනාධිපතිවරණ අපේක්ෂක

පිටපත් : අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති සහ විමර්ශන)


Registered Office: No.3/1, Sangamiththa Mawatha, Kandy.
Phone: +94812203310 / 0773079570
Email: kapila.theminimulle@gmail.com